සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය - 2

විෂය - බුද්ධ ධර්මය | ශ්‍රේණිය - 5 | 2021 සැප්තැම්බර් මාසය

සැකසුම : ඉරේෂා නිල්මිණි මිය - බලන්ගොඩ අධ්‍යාපන කලාපය

## 14.පළතුරු පැළ සිටවමු.

ආදරණීය දුවේ පුතේ " **මොනවද මුත්තේ මොකද කරන්නේ**" යන ගීතයට සවන් දෙන්න.youtube හරහා නරඹන්න.ආදර දුවේ පුතේ මේ සීයා අඹ ඇටය සිටවන්නේ සීයාට එහි අඹකන්නට සිතා ගෙන නොවේ.අනාගත පරපුර ගැන සිතාගෙන නේද?

ඉතින් දුවේ පුතේ අද අපි හැමෝම එකතු වෙලා පලතුරු පැළයක් සිටවමු නේද?

ඔයාලා සිටවපු පැළයට අවශ්‍ය ජලය,පොහොර යෙදීමත්,පැළය රැක බලා ගැනීමත් අපේ යුතුකමකි.ඒ වගෙම පුතේ වසවිසෙන් තොර පලතුරු ආහාරයට ගැනීමට හැකි වන අතර නීරෝගී මතු පරපුරක් සඳහා කරන දායාදයක්ද වනවා.

ඒ වගෙම පුතේ අපේ පැළ ආරක්ෂා කර වර්ධනයට අවශ්‍ය පහසුකම් සැලසීම පින්කමක් වෙනවා.ඉතින් පුතේ ඔයාලගේ පෙළපොතේ 14.වන පාඩම පලතුරු පැළ සිටවමු කවි පන්තිය තාලයට ගායනා කරමු නේද?

කවි පන්තිය ඇසුරින් පිලිතුරු හොයමු නේද?

1) බුදු තෙමගුල සිදු වූයේ ( සල් උයනේ / තුරු සෙවනේ ) දීය.
2) මිහිඳු හිමිට තිස්ස නිරිඳු මුණ ගැහුණේ( මිහින්තලයේ / සීගිරියේ ) දීය.
3) මිහින්තලේ පිරී තිබුණේ ( බෝ / අඹ ) රුක් වලිනි.

කවි පන්තිය ඇසුරින් පහත ප්‍රකාශය හරි නම් ✓ ලකුණද වැරදි නම් X ලකුණද යොදමු නේද මගෙ පුතේ.

1) පෙර රජ දවස සඳහන් ඉතිහාස පොතේ පලතුරු උයන් කරවූ බව ලියවී තිබුණි. (     )
2) කල්වැසි වසින්නට තුරුලතා මහ මෙහෙවරක් නොවීය.(     )
3) අපගේ මුතුන් මිත්තන් අප වෙනුවෙන් පැළ සිටුවා ඇත.(     )
4) පුංචි අපිත් පලතුරු වතු වැවිය යුතුය.(     )

බුද්ධ ධර්මය විෂයට අදාළ වීඩියෝ **enanapiyasa** වෙබ් අඩවියේ සුහුරු පාඩම් යටතේ ලබාගත හැකිය